මාගේ සමූහයාට ඉතා දුෂ්කර කාර්යයක් නොවේ නම් වුළු ධෝවනය කරන සෑම අවස්ථාවකම මිස්වාක් (දැහැටි කූරු) භාවිතයෙන් කට පිරිසිදු කරන්නැයි මම ඔවුනට නියෝග කර සිටිමි.

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “මාගේ සමූහයාට වඩාත් දුෂ්කර
කාර්යයක් නොවී නම් සෑම සලාත් අවස්ථාවකම මිස්වාක් (දැහැටි කූරු) භාවිතයෙන් කට
පිරිසිදු කරන මෙන් මම ඔවුනට නියෝග කර සිටිමි.” [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් නසාඊ එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත - ඉමාම් මාලික් එය
වාර්තා කර අැත]

සැබැවින්ම තම සමූහයාට මෙන්ම දේවත්වය විශ්වාස කළ තම අනුගාමිකයින්ට දුෂ්කරතාවක්, අසීරුතාවක් හා මහත් පරිශ්රමයක් ඇති වීම ගැන තමන් බිය නොවී නම්, සෑම වුළූ ධෝවනයක් සමගම දත් පිරිසිදු කිරීම අත්යවශ්ය අනිවාර්යය කටයුත්තක් පත් කරමින් ඒ ගැන මම ඔවුනට අණ කරමි. නමුත් ඔවුන් කෙරෙහි වූ ආදරය හා සෙනෙහස හේතුවේ එයින් එතුමා වැළකී සිටියේය. එය අනිවාර්යය කටයුත්තක් බවට පත් නොකළේය. සැබැවින්ම එය වනාහි, එය සිදු කරන්නාහට කුසල් ලබා දෙන සතුටු දායක නබි පිළිවෙතකි. එය අත්හරින්නාට දඬුවම් දෙනු නොලැබේ.

http://www.sunnah.global/hadeeth/si/show/8374